සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2024**
**Second Term Test - Grade 08 - 2024**

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් ගසන්න.**

01. ශු. ලූක් තුමාගේ සුබාරංචියේ ජේසුස් වහන්සේගේ වංශාවලිය ආරම්භ කරනු ලබන්නේ,
    i. ආබ්‍රහම්ගෙනි. ii. පේදුරු තුමාගෙනි. iii. ආදම්ගෙනි. iv. පාවුලු තුමාගෙනි.

02. ජේසුස් වහන්සේ සිය ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කරනු ලබන්නේ,
    i. ගලීලයෙනි. ii. බෙත්ලෙහෙමෙනි. iii. ජෙරුසලමෙනි. iv. ජෙරිකෝවෙනි.

03. ''එම්මානුවෙල්'' යන්නෙහි අර්ථය වන්නේ,
    i. දෙවියන් වහන්සේගේ පුතා ය. ii. දෙවියන් වහන්සේගේ මිත්‍රයා ය.
    iii. දෙවියන් වහන්සේ ගලවන සේක. iv. දෙවියන් වහන්සේ අප සමග ය.

04. නාසරෙත් නුවර ධර්ම ශාලාවේ දී ජේසුස් වහන්සේ කියවූ තම දූත කාර්යය පිළිබඳ සඳහන් වන ග්‍රන්ථය වන්නේ,
    i. ජෙරමියා ii. යෙසායා iii. එසකියෙල් iv. ලූක්

05. ජේසුස් වහන්සේගේ වචන හා ක්‍රියාවල හරය වූයේ,
    i. ශු. සභාවේ උදාව යි. ii. දේව රාජ්‍යයේ උදාව ය.
    iii. ඇදහිල්ලේ බලාපොරොත්තුව ය. iv. දේව රාජ්‍ය අතළඟ ය.

06. දෙවියන් වහන්සේ කාන්තාරයේ දී ඉශ්‍රායෙල් ජනතාවට ලබාදුන් ආහාරය වන්නේ,
    i. මන්නා භෝජන ය. ii. නුමුහුන් පූප ය. iii. තිත්ත පලා ය. iv. මිදි යුෂය

07. ආත්මික සූදානමේ අවශ්‍යතාවය ශු. පාවුලුතුමා පැහැදිලි කර දෙන ලිපිය වන්නේ,
    i. එපීස ii. ගලාති iii. 1 කොරොන්ති iv. කොලොස්සී

08. අභිවෘද්ධි ආලේපය දේවප්‍රසාද නිධාන දානය කිරීමේ බාහිර සලකුණ වන්නේ,
    i. දේව වාක්‍ය පිළිවෙත ii. ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම.
    iii. ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කිරීම. iv. සුදු වස්ත්‍රය

09. ''පරමෝත්තම දෙවියන්ගේ පුත්‍ර වූ ජේසුස් වහන්ස, ඔබත් මාත් අතර මොන ගනුදෙනුවක් ද?'' මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,
    i. ජායිරස්ගේ දුව ii. කුදු ස්ත්‍රිය
    iii. ගෙරසේනයේ දුෂ්ටාත්මාවේශ වූ මිනිසා iv. අපෝස්තුළුවරු

10. ශුද්ධ වූ ත්‍රිත්වයේ අභිරහස වටහා ගැනීමට උත්සාහ කළ ශුද්ධවන්තයා වන්නේ,
    i. ශු. පාවුලු තුමා ය. ii. ශු. අගුස්තීනු තුමා ය.
    iii. ශු. පේදුරු තුමා ය. iv. ශු. ජාකොබ් තුමා ය.

(ලකුණු 2 × 10 = 20)

**ප්‍රශ්න අංක 11 - 15 දක්වා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

11. ජේසුස් වහන්සේගේ උපත ........................................................ ආනන්ද ජනක පුවතක් බව දේවදූතයෝ ප්‍රකාශ කළහ.

12. ස්නාවක ජොහාන්තුමා ......................................... සමඟ බෙදා ගැනීමට ආරාධනා කරයි.

13. ජේසුස් වහන්සේ පාළුකරයේ දී .................................... යාච්ඤාවෙන්, නිරාහාර ශීලයෙන් හා පරීක්ෂා ජය ගනිමින් දූත සේවාව සඳහා සූදානම් වූ සේක.

14. ශුද්ධාත්ම ඵල .................................................. කි.

15. රෝග වලින් පෙළෙන ජනතාව වෙනුවෙන් අපගේ ................................................ යොමු කළ යුතු ය.

(නිරන්තර යාච්ඤාව, 12, දින 40ක්, සියලු ජනතාවට, ඇති අය නැති අය, දින 20ක්)

(ලකුණු 2 × 5 = 10)

**අංක 16 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16. ක්‍රි.ව. 80 - 85 කාලය තුළ ලූක් සුබාරංචිය සම්පාදනය විය. ( )

17. ''තියෝපිලස්'' යන්නෙහි අර්ථය 'දෙවියන් වහන්සේගේ මිත්‍රයා ය. ( )

18. දෙවියන් වහන්සේට 'අබ්බා පියාණෙනි' ලෙස ආමන්ත්‍රණය කිරීමට හැකියාව ලැබෙන්නේ ප්‍රසාද ස්පානයෙනි. ( )

19. ස්නාවක ජොහාන්තුමා උපත ලබා පස්වන දිනයේ දී චර්මඡේදන පිළිවෙත සිදු කරන ලදී. ( )

20. පූජක රජතුමෙකු වූ මෙල්කිසදෙක් ප්‍රථම වරට පූප හා මිදියුෂ ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කළේ ය. ( )

(ලකුණු 2 × 5 = 10)

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. ආබ්‍රහම් තුමා කානාන් දේශයට පිටත්ව යන විට ඔහු සමඟ ගිය පුද්ගලයන් දෙදෙනා නම් කරන්න.

ii. මෙසියස් වහන්සේ පිළිබඳ ව දිවැස් වැකි ඉදිරිපත් කළ දිවැසිවරු දෙදෙනෙක් නම් කරන්න.

iii. ලූක් සුභාරංචියේ සඳහන් කාන්තා චරිත 02ක් නම් කරන්න.

iv. ජේසුස් වහන්සේගේ ළමා කාලය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන සුබාරංචි කතුවරුන් දෙදෙනා නම් කරන්න.

v. ලූක් සුභාරංචියේ පණිවිඩ 02ක් නම් කරන්න.

vi. දිව්‍ය සත්ප්‍රසාදයේ ලක්‍ෂණ 02ක් නම් කරන්න.

vii. ''ශුද්ධාත්මයාණන්' යන යෙදුමට පුරාණ ගිවිසුමේ භාවිත කරන යෙදුම් 02ක් නම් කරන්න.

viii. ශුද්ධ වූ ත්‍රිත්වයේ තැනැන් වහන්සේලා දෙදෙනෙක් නම් කරන්න.

ix. අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව දානය කළ හැකි පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.

x. ජේසුස් වහන්සේව බෞතීස්මය කළ පුද්ගලයා හා බෞතීස්මය ලද ස්ථානය නම් කරන්න.

(ලකුණු 2 × 10 = 20)

02. i. ලූක්තුමා සතු වූ විශේෂ හැකියා 02ක් නම් කරන්න.

ii. ලූක් සුභාරංචිය හඳුන්වන වෙනත් නම් 03ක් ලියන්න.

iii. දක්‍ෂ ලේඛකයෙක් වූ ශු. ලූක්තුමාගෙන් ඔබට ලබාගත හැකි ආදර්ශ 05ක් නම් කරන්න. (ලකුණු 2+3+5=10)

03. i. ස්නාවක ජොහාන්තුමාගේ දෙමාපියන් නම් කරන්න.

ii. ස්නාවක ජොහාන්තුමා දේශනය යොමුවූ කණ්ඩායම් 03ක් නම් කරන්න.

iii. පන්ති නායකයෙකු ලෙස ස්නාවක ජොහාන්තුමාගේ ජීවිතයෙන් ලබාගත හැකි ආදර්ශ 05ක් නම් කරන්න. (ලකුණු 2+3+5=10)

04. i. වපුරන්නා පිළිබඳ උපමාවේ බීජ වැටුණු බිම් වර්ග 02ක් නම් කරන්න.

ii. ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා 03ක් නම් කරන්න.

iii. දේව රාජ්‍යය උරුම කර ගැනීමට ඔබට කළ හැකි කාර්යයන් 05ක් නම් කරන්න. (ලකුණු 2+3+5=10)

05. i. මාරුත දමනයේ ප්‍රාතිහාර්යයෙන් අපට පෙන්වා දෙන කරුණු 02ක් ලියන්න.

ii. ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය වර්ග 03ක් නම් කරන්න.

iii. ඔබේ ජීවිතය තුළ ප්‍රාතිහාර්යයන් අත්දැකීමට ඔබ කළ යුතු කාර්යයන් 05ක් නම් කරන්න. (ලකුණු 2+3+5=10)

06. i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් විය යුතු ආකාර 02ක් කරන්න.

ii. දිව්‍ය පූජාවෙන් පරිබාහිරව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට අවසර ඇති අවස්ථා 03ක් නම් කරන්න.

iii. දිව්‍ය සත්ප්‍රසාදය ලැබූ ඔබ දිව්‍ය පූජාවට ක්‍රියාකාරීව සහභාගී විය හැකි ආකාර 05ක් නම් කරන්න.

(ලකුණු 2+3+5=10)

07. i. ශුද්ධාත්ම දීමනා 02ක් නම් කරන්න.

ii. අභිවෘද්ධි ආලේපය නැමති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් 03ක් නම් කරන්න.

iii. අභිවෘද්ධි ආලේපය ලැබූවන්ගේ යුතුකම් 05ක් නම් කරන්න. (ලකුණු 2+3+5=10)